ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ
***

## පුවත්පත් නිවේදනය

ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණය ඒකාබද්ධව සංවර්ධනය කිරීම සහ මෙහෙයවීම සම්බන්ධයෙන් ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර ඇති කර ගෙන තිබූ අවබෝධතාවය 'අහෝසි' කර ඇතැයි ඇතැම් මාධ්‍ය විසින් පළ කර ඇති වාර්තාවන්හි සත්‍යතාවයක් නොමැත.

මෙම වාර්තා 2021 පෙබරවාරි 17 වන දින ශ්‍රී ලංකාවේ බලශක්ති අමාත්‍යතුමා විසින් සිදු කරන ලද ප්‍රකාශයන් නිවැරදිව දක්වා නැත. අද පැවති මාධ්‍ය හමුවකදී අමාත්‍යතුමා විසින්ම මෙම කරුණු දීර්ඝ වශයෙන් පැහැදිලි කරන ලදී.

එම මාධ්‍ය හමුවේදී අමාත්‍යතුමා විසින් ද දැක්වූ පරිදි දෙරටෙහි රජයන්, 2017 වසරේදී ඇතිකර ගත් අවබෝධතා ගිවිසුම ඇතුළු පවත්නා ද්විපාර්ශවික අවබෝධතා අනුව තෙල් ටැංකි සංකීර්ණය ඒකාබද්ධව සංවර්ධනය කිරීම සහ මෙහෙයවීම සඳහා අන්‍යෝන්‍ය වශයෙන් පිළිගත හැකි ක්‍රමවේදයන් පිළිබඳව එකිනෙකාගෙන් අදහස් විමසා ඇත.

ඉන්දියාව මෙම කරුණ සම්බන්ධයෙන් නිල සාකච්ඡා පැවැත්වීමට ද එම සාකච්ඡාවන්හි ප්‍රතිඵල අන්‍යෝන්‍ය සුබසිද්ධිය වෙනුවෙන් කඩිනමින් ක්‍රියාත්මක කිරීමට ද අපේක්ෂා කරයි.

******

කොළඹ
2021 පෙබරවාරි 18